රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය
தொலைபேசி: **(94) 011- 2694560**
Telephone

ෆැක්ස්
தொலைநகல்: **(94) 011- 2692254**
Fax

ඊ-මේල්
மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk**
E-mail

වෙබ් අඩවිය
இணைத்தளம்: **www.pubad.gov.lk**
Web Site

මගේ අංකය / எனது இல / My No: R/3/3/2016

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2018.01.23

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්,

<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාග - 2016</u>

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම හා බැඳේ.

02. මේ වනවිට ඔබ ආයතනයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පවත්නා පුරප්පාඩු පිළිබඳ තොරතුරු **2018 පෙබරවාරි 05** වන දින හෝ ඊට පෙර PACIS මෘදුකාංග පද්ධතියේ යාවත්කාලීන කර අවසන් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. එක් එක් සේවා ස්ථාන වල පුරප්පාඩු පවතින බවට නිලධාරින්ගේ ඉල්ලීම මත ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන ලිපි මා විසින් භාරගනු ලැබුව ද එම පුරප්පාඩු ඉහත දින වන විට PACIS මෘදුකාංගයේ යාවත්කාලීන වී නොමැති නම් පුරප්පාඩු පිරවීම සහ ස්ථාන මාරු සඳහා සලකා නොබලන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

04. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවාගැනීමේ සීමිත තරග විභාගය (2016) සමත්ව සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලබා ඇති නිලධාරින් මෙතෙක් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත්කර නොමැති බැවින් එම නිලධාරින්ගේ ඉල්ලීම මත ආයතන වල පුරප්පාඩු පවතින බවට ලිපි නිකුත් කිරීම නුසුදුසු වන අතර එසේ කිරීමෙන් වළකින ලෙස ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

05. තවද ඉදිරියේදී ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිත රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවාගැනීමේ විවෘත තරග විභාගය සම්බන්ධයෙන්ද ඉහත (04) ඡේදයේ සඳහන් කරුණ අදාළ වන බව සැලකුව මැනවි.

කේ.වී.පී.එම්.ජේ. ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්